**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2015**

---

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 5 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට තවත් ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය වේ. සාධාරණ වටිනාකම සැළකිය යුතු තරම් හා ඉක්මන් වෙනස්වීම් වලින් යුක්ත වන විට වාර්ෂික ප්‍රත්‍යාගණනයක්ද, සැළකිය යුතු නොවන තරම් වෙනස්වීම් පමණක් තිබෙන විට වර්ෂ තුනකට හෝ පහකට වරක්ද ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රමාණවත් වුවද මාණ්ඩලික විද්‍යාලයේ දේපල පිරියත හා උපකරණ 2010 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර එහි සාධාරණ අගය හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

පිරිවැය රු.3,057,824 ක් වූ ඉන්ධන මනුකරණ 02 ක් යන්ත්‍රෝපකරණ යටතේ සියයට 12.5 බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිට එය ගොඩනැගිලි යටතේ සියයට 2 බැගින් ක්ෂය කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී මාණ්ඩලික විද්‍යාලයට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් සැපයූ ඉන්ධන වෙනුවෙන් රු.මිලියන 6.08 ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවට ඍජුවම ප්‍රේෂණය කර තිබුණු නමුත් එම මුදල ගෙවිය යුතු වියදමක් වශයෙන් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ගෙවිය යුතු රු.73,860 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) 2015 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.51,690,915 ක් වූ ජංගම නොවන වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේදීද රු.10,338,183 ක ක්ෂය ප්‍රතිපාදනය සිදු කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීතී රීතී රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2012 අංක 13 දරණ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය සංශෝධන පනත | |
| | (i) 17(අ) 3 වගන්තිය | සිවිල් පරිපාලන කටයුතු කරගෙන යාම සඳහා ස්ථිර සිවිල් පරිපාලන නිලධාරියෙකු පත්කර නොතිබුණි. |
| | (ii) 22(2) වගන්තිය | මාණ්ඩලික විද්‍යාලයේ ගණකාධිකාරී තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට අයත් නිලධාරියෙකු පත්කල යුතු වුවත් 2015 වර්ෂයේදී පුරප්පාඩු වූ එම තනතුරට, 2016 ජනවාරි වන විටත් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2013 ජුනි 05 දිනැති ජනාධිපති ලේකම්ගේ අංක පීසීඑම්ඩී/පීආර්/2013 ලිපිය | විද්‍යාලය සතු ත්‍රීරෝද රථයක් සහ යතුරු පැදි 2 ක් වසර තුනකට අධික කාලයක සිට ධාවනයෙන් ඉවත් කර විද්‍යාල පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් පවතින අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 395 | බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 770 | භාවිතාකළ නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය | අයවැයගත ආදයම් වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,135,983 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,251,729 ක ඌනතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු 18,387,712 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වෙනත් ආදායම් රු.22,444,476 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.2,017,213 ක් ව පැවති විද්‍යාලයේ ඌනතාවය 2012 වර්ෂය වන විට රු.6,410,036 දක්වා වැඩිවී තිබුණි. 2013 වන විට එය රු.1,115,201 ක් දක්වා අඩුවී තිබූ අතර 2014 වර්ෂය වන විට රු.3,251,730 දක්වා නැවත වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 සිට 2014 දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් දක්නට ලැබුණු අතර එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි.

සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.53,113,923 ක් ව පැවති විද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂය වන විට රු.51,188,595 ක් දක්වා අඩුවී තිබුණද 2013 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.116,703,502 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2008 අංක 5 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනත ප්‍රකාරව සන්නද්ධ හමුදා වල නිලධාරීන්ට උචිත පත්වීම් හා උසස්වීම් සඳහා ඔවුන්ට අවශ්‍ය වෘත්තීය දැනුම ලබාදීම හා විද්‍යාලයේ පුහුණුව ලබන නිලධරයින් අණ හා මාණ්ඩලික කර්තව්‍ය යන අවස්ථා දෙකෙහිදීම ඵලදායීව ක්‍රියාකිරීම සඳහා සූදානම් කිරීම විද්‍යාලයේ මූලික අරමුණු වේ.

පනත ප්‍රකාරව මාණ්ඩලික විද්‍යාලයේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍යවන මහාචාර්ය පදවි, ආචාර්ය පදවි හා වෙනත් තනතුරු ඇති කළ යුතු වූවත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම එම පත්කිරීම් සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් භූමියෙන් අක්කර 11 ක ඉඩම් ප්‍රමාණයක් 2011 වර්ෂයේදී විද්‍යාලය වෙත පවරා දී ඇතත් එයට අදාල ඔප්පුව 2015 දෙසැම්බර් 31 දින තෙක් ලබා ගෙන නොතිබුණි. එමෙන්ම මෙම ඉඩමේ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) විද්‍යාලයේ කටයුතු සඳහා වසර ගණනාවක් තිස්සේ උපයෝගී කරගෙන තිබූ ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදාව සතුව පැවති පිරිවැය රු. 51,586,500 ක්වූ මෝටර් වාහන 33 ක් 2016 ජුනි 03 දින වන විටත් විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විදේශ ශිෂ්‍ය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය තුලදී විද්‍යාලය වෙත ලැබී තිබුණු පාඨමාලා ගාස්තුවෙන් රු. මිලියන 3 ක් යොදවා අරමුදලක් පිහිටුවා විද්‍යාලයේ සේවය කරන සිවිල් සේවකයන්ට ආපදා ණය ලබා දීමට 2015 අගෝස්තු 10 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත් 2016 ජුනි 3 දින වන විටත් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### 4.3 වාහන උපයෝජනය

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මෝටර් වාහන 5 ක් මාණ්ඩලික විද්‍යාලයේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනම මත ලබා ගෙන තිබුණි. විද්‍යාලය විසින් අදාල පාර්ශවයන් සමග මෝටර් වාහන පාවිච්චි කිරීම, ගාස්තු අය කිරීම, අළුත්වැඩියා හා නඩත්තු කටයුතු පිළිබඳ කිසිදු ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.3,001,600 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි.

### 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

විද්‍යාලයේ ශිෂ්‍ය හා නිලධාරී නිවස්නයන් සඳහා ගොඩනැගිලි 03 ක් ඉදිකිරීමේ කටයුතු 2012 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පවරා තිබුණි. ගුවන් හමුදාව විසින් රේඛීය

අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව මෙම ඉදිකිරීම් වලින් එක් ගොඩනැගිල්ලක් සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත රු.27,882,332 ක පිරිවැයකට 2012 දෙසැම්බර් 13 දින පවරා තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකත්වය හේතුවෙන් 2013 ජුනි 26 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. කොන්ත්‍රාත්තුව අවලංගු කරන දින වන විට කොන්ත්‍රාත්කරු වෙත රු.7,172,473 ක් ගෙවා තිබුණු අතර කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු ප්‍රමාද ගාස්තු රු.1,224,260 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් කටයුතු රු.28,355,117 ක කොන්ත්‍රාත්තුවකට වෙනත් පාර්ශවයකට පිරිනමා තිබුණි. ඒ අනුව මෙම ඉදිකිරීම සඳහා රු.35,527,590 ක මුදලක් වැය කර තිබූ අතර මුල් කොන්ත්‍රාත්තුව සමඟ සැසඳීමේදී රු.7,645,258 ක අමතර පිරිවැයක් හා වසර දෙකකට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 13 දිනදීය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2015 වර්ෂයේ මාණ්ඩලික විද්‍යාලය විසින් සකස් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ විද්‍යාලයේ ප්‍රාග්ධන වියදම් හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා දැරීමට අපේක්ෂිත වියදම් ඇතුලත් කර තිබුණු අතර ඒවා ශිෂ්‍ය නිලධාරීන්ගේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම ඇතුලු අනෙකුත් ප්‍රධාන අරමුණු වලට අදාල කරගන්නා ආකාරය පිළිබඳ තොරතුරු ඇතුලත් කරමින් එය සකස් කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

----------------------

2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනතේ 21 (2) වගන්තිය අනුව විද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය සඳහා ස්ථිර අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායකගේ අවධානය යොමු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආරම්භක ගිණුම් ශේෂ, වැරදි නිවැරදි කිරීම් හා ගැලපුම් සටහන් ආදිය ලෙජර් ගිණුම් වල පිටපත් කිරීමට අවශ්‍ය ජර්නල් වවුචර් පිළියෙල කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.